# ප්‍රාග් ඓතිහාසික මානවයා විසූ බවට අනුමාන කළහැකි පොල්ගහවෙල ප්‍රදේශයේ පිහිටි ගල්ලෙනක් පිළිබඳ ගවේෂණයක්

පියුමාලි සෙනවිරත්න[6]

ප්‍රාග් ඓතිහාසික මානවයා ඔහුගේ ජීවන ගමන් මග තුළ තම පැවැත්ම තහවුරු කර ගැනීම උදෙසා විවිධ ඉසව් සොයා ගෙන ගිය බවට ප්‍රාග් ඓතිහාසය විෂය තුළ හඳුනාගෙන ඇත. ඒ පරිණාම ගමන් මගෙහි දී අත්දැකීමෙන් ලබාගත් පරිකල්පන ඥානය තුළින් අතීත මානවයා ඔහුගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම, ඒ සඳහා අවශ්‍ය සම්පත් සොයාගැනීම හා ඒවා දියුණු කර ගැනීම හඳුනාගත හැකි ය. තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ දී ඔහු ප්‍රධාන වශයෙන් තමා ජීවත් වූ පරිසරය කෙරෙහි අවධානය යොමු කරන්නට ඇත. එහි දී තම පැවැත්ම උදෙසා ඉවහල් වන ආහාර, වාසස්ථාන හා ජලය යන සාධකයන් පරිපූර්ණ වූ ස්ථාන තම වාසය සඳහා තෝරාගන්නට ඇත. මෙම අධ්‍යයනයෙහි අරමුණු වන්නේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොරොස්ස කඳුවැටියේ පවත්නා ගල් ලෙනකින් හමු වන සාධක වල පුරාවිද්‍යාත්මක හා ප්‍රාග් ඓතිහාසික වැදගත්කම හඳුනාගැනීම ය. මෙම තොරතුරු අත්පත් කර ගැනීමේ දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස පුස්තකාල පරිශීලනය හා ක්ෂේත්‍ර ගවේෂණය යන ක්‍රමවේද අනුගමනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී බොහොමයක් සාධක මධ්‍යශිලා යුගය ඇසුරින් අනාවරණය කර ගෙන ඇත. මේ අධ්‍යයනය තුළ දී හඳුනාගත් පොල්ගහවෙල ප්‍රදේශයේ පිහිටි මෙම ගල් ගුහාව පහතරට තෙත් කලාපයට ආසන්න ව මධ්‍යම කඳුකරයේ බටහිර කඳුබෑවුම් ආශ්‍රිත ව පිහිටා තිබේ. ගල්ගුහාව මතුපිට ප්‍රදේශය මීටර් 2.5 × 6 පමණ දිගින් හා පළලින් යුක්ත වන අතර ගුහාවේ කටාරය හා මැටි බිත්තියක සාධක දැකගත හැකි ය. මෙහි මතුපිට කුමක් හෝ අරමුණකින් තරමක් ගැඹුරට හාරා ඇති බවට හඳුනාගත හැකි අතර ඒ ආශ්‍රිත පස් අතර තිබී ශිලා මෙවලම් යැයි උපකල්පනය කළ හැකි සාධක ද ගස් ගොළුබෙල්ලන්, දිය ගොළුබෙල්ලන්, මුහුදු බෙල්ලන්ට අයත් යැයි අනුමාන කළ හැකි සාධක ද හමු වේ. මෙම ගල්ගුහාව අයත් පාරිසරික කලාපයේ ඇති පුරාවිද්‍යා ස්ථාන වශයෙන් කිතුල්ගල බෙලිලෙන, ගම්පහ වාරණ, පිළිකුත්තුව, අලව්ව හක්බෙලිකන්ද, බුලත්සිංහල ෆාහියන් ලෙන හඳුනාගත හැකි ය. ගල්ගුහාව පිහිටි පාරිසරික කලාපය පහතරට තෙත් කලාපීය පාරිසරික සාධක ආසන්න වශයෙන් පෙන්නුම් කරන අතර වර්තමානයේ යම් තරමක ජල මූලාශ්‍ර, ශාක හා සත්ත්ව ගහනයක් දැකගත හැකි වේ. මෙ බඳු තෙත් කළාපීය ගල්ගුහා තුළින් මධ්‍යශිලා අවධිය නියෝජනය කරන හෙයින්, මෙයින් හමුවන සාධක ද මධ්‍යශිලා අවධිය නියෝජනය කරනවා යැයි උපකල්පනය කළ හැකි ය. මේ අනුව මෙම ස්ථානයේ මතුපිට දක්නට ඇති සාධක සේම පාරිසරික සාධක පිළිබඳ ව අධ්‍යනය කිරීමෙන් පෙනී යන්නේ මේ ගුහාව ආශ්‍රිත ව ප්‍රාග් ඓතිහාසික මාවනයා දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන වාසස්ථානයක් ලෙස භාවිත කරන්නට ඇති බව ය.

ප්‍රමුඛ පද: ප්‍රාග් ඉතිහාසය, පොල්ගහවෙල, ගල් ගුහාව

[6] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, piyumsenavirathna@gmail.com